රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 02/98

මගේ අංකය : ආ/IV/5/2-1
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
1998 ජනවාරි මස 23 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,
සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ප්‍රධානීන්,
දිසාපතිවරුන්/දිස්ත්‍රික් ලේකම්වරුන්.

## ජනවාර්ගික හා භාෂා හැකියාව අනුව රාජ්‍ය සේවයේ නිලධාරීන් සම්බන්ධ විස්තර

රටේ රාජ්‍ය සේවය සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සපයන ලෙස රජය නියෝග කර කර ඇත.

* සෑම අංශයකම සිටින රාජ්‍ය නිලධාරීන්ගේ මුළු සංඛ්‍යාව.
* රජයේ නිලධාරීන්ගේ මුළු සංඛ්‍යාව, නිල නාමය, සේවාව සහ ජනවාර්ගික ස්වභාවය අනුව වෙන් වෙන් වශයෙන්
* සෑම අංශයකම රජයේ සේවකයින්ගේ මුළු සංඛ්‍යාව ද්විභාෂික සහ ත්‍රෛභාෂික ප්‍රවීණතාවය අනුව වෙන් වෙන් වශයෙන්.

ඔබගේ පාලනය යටතේ සිටින සියළුම සේවකයින් සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා මෙයට අමුණා ඇති ආකෘතිය යොද ගත හැකි බව දන්වන අතර, එම විස්තර මට ද පිටපතක් සහිතව, අධිකරණ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු, ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධ අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වෙත කෙලින්ම අංක 152, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයට හැකි ඉක්මණින් යවන ලෙස දැනුම් දෙමි.

මෙම කටයුත්ත ඉතාමත්ම හදිසි කරුණක් බව කරුණාවෙන් සලකන්න.

අ.කලේ/(ඩික්සන් නිලවීර)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

**<u>ජනවාර්ගික තත්ත්වය හා භාෂා හැකියාව අනුව</u>**
**<u>රාජ්‍ය සේවයේ සේවකයින් සම්බන්ධ විස්තර</u>**

**ආයතනයේ නම සහ ලිපිනය :-**

**අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/**
**සංස්ථාව/ව්‍යවස්ථාපිත මණ්ඩලය**
**පළාත් සභාව :-**

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | | | 8 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | නිල නාමය තනතුර | සේවයේ නම | අංක 2/97 රා.පරි.ච. අනුව වැටුප් කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | ජනවාර්ගික පදනම අනුව සංඛ්‍යාව | | | භාෂා හැකියාව අනුව සංඛ්‍යාX | | | |
| | | | | | | දෙමළ | සිංහල | මුස්ලිම් | සිංහල /දෙමළ | සිංහල /ඉංග්‍රීසි | දෙමළ /ඉංග්‍රීසි | සිංහල /ඉංග්‍රීසි /දෙමළ |
| | | | | | | | | | | | | |

X කියවීම, ලිවීම සහ කථා කිරීමට
හැකියාව ඇති අය

අත්සන :
නම :
නිල නාමය :

දිනය :